සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | ව්‍යවසායකත්ව අධ්‍යයනය - I | කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

01. ව්‍යවසායකයා තමාගේ අභිමතය පරිදි තීරණ ගැනීම හා වැඩ කටයුතු කිරීම සිදු කරයි. මෙම ප්‍රකාශයෙන් ගම්‍යවන ව්‍යවසායකත්ව ගති ලක්‍ෂණය තෝරන්න.
    (1) ස්වාධීනත්වය යි. (2) අනාගත දැක්ම යි.
    (2) නිර්මාණශීලීත්වය යි. (4) ස්වයං පෙළඹවීම යි.

02. භාණ්ඩයක ලක්‍ෂණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) අස්පෘශ්‍ය වීම, ගබඩා කළ හැකි වීම, සමජාතීය වීම.
    (2) සමජාතීය වීම, ගබඩා කළ හැකි වීම, ස්පෘශ්‍ය වීම.
    (3) සමජාතීය වීම, පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසක් වීම, ස්පෘශ්‍ය වීම.
    (4) සපයන්නාගෙන් වෙන්කළ හැකි වීම, අස්පෘශ්‍ය වීම, සමජාතීය බව ආරක්‍ෂා කළ හැකි වීම.

03. පහත ප්‍රකාශ අතරින් නවෝත්පාදනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) නවෝත්පාදනය ස්වභාවධර්මයෙන් නිර්මාණය වූ දෙයකි.
    (2) නවෝත්පාදනයේ ආරම්භය අපේක්ෂිත සිදුවීමකි.
    (3) නවෝත්පාදනයේ ආරම්භය නිර්මාණශීලී අදහසකි.
    (4) නවෝත්පාදන බිහිවන්නේ දැනුම පදනම් කරගත් සංකල්ප හරහා පමණකි.

04. පරිසරයේ සිදුවන වෙනස්වීම්වල බලපෑම ඉවෙන් මෙන් ක්‍ෂණිකව දැන ගැනීමට ඇති හැකියාව හඳුන්වන්නේ,
    (1) ආත්ම විශ්වාසය ලෙස ය. (2) ස්වාධීනත්වය ලෙස ය.
    (3) තොරතුරු සොයා බැලීම ලෙස ය. (4) සාමාන්‍ය වැටහීම ලෙස ය.

05. දැඩි ප්‍රතිපත්තිවල එල්බ නොසිට, තමා විසින් ගත් තීරණ, අවස්ථාවට ගැළපෙන ලෙස වෙනස් කිරීමට කැමති පුද්ගලයෝ හඳුන්වන්නේ,
    (1) ස්වාධීන පුද්ගලයින් ලෙස ය. (2) සුභවාදී පුද්ගලයින් ලෙස ය.
    (3) දැක්මක් සහිත පුද්ගලයින් ලෙස ය. (4) නම්‍යශීලී පුද්ගලයින් ලෙස ය.

06. ව්‍යවසායකයින් විසින් ලබන මූල්‍යමය ප්‍රතිලාභ හඳුන්වන්නේ,
    (1) ආකර්ෂණීය ලාභය ලෙස ය. (2) ධනය ලෙස ය.
    (3) විකුණුම් ආදායම ලෙස ය. (4) ප්‍රාග්ධනය ලෙස ය.

07. දිනුදු නවීන යන්ත්‍රෝපකරණ භාවිත කරමින් ඔසුපැන් නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යයි. ඔහු යටතේ සේවකයින් දෙදෙනෙක් සේවය කරන අතර ව්‍යාපාර කටයුතු සියල්ල සැලසුම්කර ක්‍රියාත්මක කරන්නේ දිනුදු විසිනි. මෙහි සඳහන් නිෂ්පාදන සාධක පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) ප්‍රාග්ධනය, ශ්‍රමය, ව්‍යවසායකත්වය (2) ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, ශ්‍රමය
    (3) ව්‍යවසායකත්වය, ශ්‍රමය, ප්‍රාග්ධනය (4) භූමිය, ශ්‍රමය, ව්‍යවසායකත්වය

08. සැලසුමකට අනුව කටයුතු සිදුවනවා දැයි සොයා බැලීම අයත් වන්නේ,
    (1) ව්‍යාපාරිකයාගේ භූමිකාවට ය. (2) කළමනාකරුගේ භූමිකාවට ය.
    (3) අයිතිකරුගේ භූමිකාවට ය. (4) උපදේශකයින්ගේ භූමිකාවට ය.

09. ද්විතියික අංශයට අයත් ව්‍යාපාර පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
    (1) බැංකු, මසුන් ඇල්ලීම, එළවළු වගා කිරීම
    (2) මල් වගාව, මසුන් ඇල්ලීම, එළවළු වගා කිරීම
    (3) සපත්තු නිෂ්පාදනය කිරීම, මසුන් අලෙවි කිරීම, බැංකු
    (4) සපත්තු නිපදවීම, බෑග් නිපදවීම, ගොඩනැගිලි ඉදිකිරීම

10. ව්‍යාපාරිකයින්ට වඩා ව්‍යවසායකයින් තුළ දැකිය හැකි සුවිශේෂී ලක්‍ෂණයක් වන්නේ,
    (1) අවදානම් භාර ගැනීමයි. (2) ඉහළ ලාභයක් ලැබීමයි.
    (3) නවෝත්පාදනය බිහි කිරීමයි. (4) පොදු අරමුණක් පැවතීමයි.

11. ව්‍යාපාරිකයින්ගේ ලාභය තීරණය කරනු ලබන ප්‍රධාන ම සාධකය වන්නේ,
    (1) භාණ්ඩයේ මිලයි. (2) නිෂ්පාදිතයේ ගුණාත්වයයි.
    (3) ව්‍යාපාරික ස්ථානයයි. (4) ව්‍යාපාරිකයාගේ විශ්වාසවන්ත භාවයයි.

12. ව්‍යාපාරයක් කාලානුරූපීව වෙනස් නොවී කටයුතු කිරීම, එම ව්‍යාපාරය සතු,
    (1) ශක්තියකි. (2) තර්ජනයකි.
    (3) අවස්ථාවකි. (4) දුර්වලතාවයකි.

13. ව්‍යාපාරිකයින්ට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන පසුබිම සපයනු ලබන්නේ,
    (1) දක්ෂ කළමනාකරුවන් විසිනි. (2) ව්‍යාපාරික පරිසර සාධක මගිනි.
    (3) දිරිගැන්වීම් සපයන ආයතන විසිනි. (4) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා මගිනි.

14. ව්‍යවසායකයකු සතු විය යුතු සන්නිවේදන කුසලතාවයක් වන්නේ,
    (1) කණ්ඩායමක් ලෙස එකට එකතු වී වැඩ කිරීම.
    (2) ආයතනයේ විවිධ පාර්ශව අතර තොරතුරු බෙදාහැරීම.
    (3) සමස්ථයක් ලෙස සලකා ව්‍යාපාරය පිළිබඳ ව තීරණ ගැනීම.
    (4) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා නිසි පරිදි හඳුනා ගැනීම.

15. කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයකි.
    (1) ඉහළ ප්‍රතිලාභ සහිත ව්‍යාපාර කටයුතුවල නියැලීම.
    (2) ණය ලබාගෙන ව්‍යාපාර කටයුතු පුළුල් කර ගැනීමට කටයුතු කිරීම.
    (3) ව්‍යාපාරයට අදාළව නිවැරදි සැලසුම් සැකසීම හා ඒ අනුව කටයුතු කිරීම.
    (4) ජනප්‍රිය ව්‍යාපාර අනුකරණය කරමින් එම ක්ෂේත්‍රයේ ම ව්‍යාපාර කටයුත්තක නියැලීම.

16. ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වන අවස්ථාවක් වන්නේ,
    (1) ව්‍යාපාරයට සේවකයින් බඳවාගැනීමේ දී ය.
    (2) ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීමේ දී ය.
    (3) ව්‍යවසායකයකු විසින් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ය.
    (4) බැංකු ණයක් ලබා ගැනීමට අවශ්‍ය වන ඇප ඉදිරිපත් කිරීමේ දී ය.

17. මිනිස් අවශ්‍යතා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) අවශ්‍යතා කාලානුරූපීව වෙනස් වේ.
    (2) අවශ්‍යතා උත්පත්තියත් සමග ම ඇති වේ.
    (3) අවශ්‍යතා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.
    (4) අවශ්‍යතා නිර්මාණය කරනු ලබන්නේ ව්‍යාපාරිකයෝ වේ.

18. සමාජයීය ව්‍යවසායකයා යනු,
    (1) නවෝත්පාදන සමාජයට ඉදිරිපත් කරන්නා ය.
    (2) ව්‍යාපාරයේ අභ්‍යන්තර ගැටලු විසඳන්නා ය.
    (3) සමාජයේ දැවෙන ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කරන්නා ය.
    (4) ඉහළ ප්‍රතිලාභ අත්කර දිය හැකි ව්‍යාපාර කටයුතුවල නියැලෙන්නා ය.

19. වෙළෙඳපොළ විශ්ලේෂණයක දී අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ,
    (1) ඉලක්කගත පාරිභෝගිකයා (2) විකුණුම් සම්බන්ධ ආදායම
    (3) අමුද්‍රව්‍ය සඳහා යන පිරිවැය (4) අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීමේ පහසුව

20. රුසිරු නැවුම් සුවඳකින් යුත් රෙදිසෝදන සබන් වර්ගයක් වෙළෙඳපොළට හඳුන්වා දෙයි. මේ අනුව රුසිරු වෙළෙඳපොළට පිවිසෙන්නේ,
    (1) නව භාණ්ඩයක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කරමින් ය.
    (2) නව භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කරමින් ය.
    (3) පවතින භාණ්ඩයක් පවතින වෙළෙඳපොළට ඉදිරිපත් කරමින් ය.
    (4) පවතින භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කරමින් ය.

21. නිෂ්පාදන ආයතනයක අමුද්‍රව්‍ය පිරිවැය සැලකිල්ලට ගනු ලබන්නේ,

(1) ආයෝජන පිරිවැය ගණනය කිරීමේදී ය. (2) බෙදාහැරීමේ වියදම් ගණනය කිරීමේදී ය.

(3) නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කිරීමේදී ය. (4) නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී ය.

22. ව්‍යාපාරයක සඳහා පිළියෙල කරනු ලබන පරිපාලන සැලැස්මක අන්තර්ගත වන තොරතුරකි.

(1) වෙළෙඳපොළ විශ්ලේෂණය (2) සේවක වැටුප් හා වේතන

(3) අලෙවි ආදායම් හා වියදම් (4) ස්වකිය නිෂ්පාදිතය සඳහා ඇති ඉල්ලුම

23. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දැරීමට සිදුවන වියදමකි,

(1) ප්‍රචාරණ වියදම් (2) අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ වියදම්

(3) වෙළෙඳපොළ සමීක්ෂණ වියදම් (4) යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේ වියදම්

24. ව්‍යාපාරයක් විසින් පිළියෙල කරනු ලබන ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත මූලිකාංගයකි.

(1) ව්‍යාපාරයේ නම (2) විධායක සාරාංශය

(3) කර්මාන්ත ක්ෂේත්‍රය (4) ඉලක්කගත පාරිභෝගිකයා

25. "තරගකරුවන්ගේ සැපයුම් විශ්ලේෂණය" ඇතුළත් වන්නේ,

(1) මූල්‍ය සැලැස්මෙහි ය. (2) නිෂ්පාදන සැලැස්මෙහි ය.

(3) පරිපාලන සැලැස්මෙහි ය. (4) අලෙවි සැලැස්මෙහි ය.

26. ව්‍යාපාරයක් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයක් වන අයිතිකරුවන්ගේ ප්‍රධාන ම අපේක්ෂාව වන්නේ,

(1) පරිසර සුරක්ෂිතතාවය යි. (2) ආයෝජනයෙහි සුරක්ෂිතතාවය යි.

(3) සේවක සුරක්ෂිතතාවය යි. (4) සමාජයේ සුරක්ෂිතතාවය යි.

27. කුඩා ප්‍රමාණයේ පිටිකළ පොල්කිරි පැකට් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේදී යොදා ගනු ලබන පිවිසුම් උපාය මාර්ගය වන්නේ,

(1) නිෂ්පාදිත ප්‍රභේදනය කිරීම. (2) නවෝත්පාදනයන් ඉදිරිපත් කිරීම.

(3) වෙළෙඳපොළ හිඩැස පිරවීම. (4) සුවිශේෂී නව භාණ්ඩයක් ඉදිරිපත් කිරීම.

28. ව්‍යවසායකයෙකුට මුහුණ දීමට සිදුවන අවස්ථා හා තර්ජන හඳුනා ගැනීමට අධ්‍යයනය කළ යුතු වන්නේ,

(1) අභ්‍යන්තර පරිසරය යි. (2) බාහිර පරිසරය යි.

(3) ආසන්න පරිසරය යි. (4) තරගකාරී පරිසරය යි.

29. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී යොදා ගනු ලබන ප්‍රාග්ධනය සඳහා නිදසුනක් වන්නේ,

(1) ගොවිතැන සඳහා යොදා ගනු ලබන වැසි ජලය

(2) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන මිනිසුන්ගේ කායික ශක්තිය

(3) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන විදුලි බලය

(4) නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගනු ලබන නිර්මාණශීලීත්වය

30. ව්‍යවසායකයෙකුට සමාජ සුභසාධනය සඳහා දායක විය හැකි ක්‍රමයකි,

(1) රටේ නිෂ්පාදනය ඉහළ නැංවීම මගින්.

(2) ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මගින්.

(3) ස්වභාවික සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම මගින්.

(4) හදිසි ස්වභාවික විපත්වල දී උපකාර කිරීම මගින්.

31 වර්තමාන ව්‍යාපාර පරිසරයේ දැකිය හැකි ප්‍රධාන ම ලක්ෂණයක් වන්නේ,
(1) ලාභය ප්‍රධාන අරමුණ වීම. (2) අවශ්‍යතා හා වුවමනා සරල වීම.
(3) පාරිභෝගිකයා බලවත් වීම. (4) තරගකාරීත්වය සරල වීම.

32. යෝජිත ව්‍යාපාරයක් සඳහා ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී අපේක්ෂිත ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය ඇතුළත් කළ යුත්තේ,
(1) ආයෝජන සැලැස්මට ය. (2) පරිපාලන සැලැස්මට ය.
(3) මූල්‍ය සැලැස්මට ය. (4) අලෙවි සැලැස්මට ය.

33. පරිසරයට හෝ වෙනත් කිසිඳු පාර්ශවයකට හානි සිදු නොවන සේ ව්‍යාපාර කටයුතු සිදුකළ යුත්තේ,
(1) ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියකට අනුව ය. (2) රජයේ නීති රීතිවලට අනුව ය.
(3) ව්‍යාපර නීතිරීති පද්ධතියකට අනුව ය. (4) අයිතිකරුවන්ගේ ප්‍රතිපත්තිවලට අනුව ය.

34. ව්‍යාපාරයක් සඳහා පිළියෙල කරනු ලබන මුළු ආයෝජන ඇස්තමේන්තුවක ඇතුළත්වන කාරක ප්‍රාග්ධනයෙන් පෙන්නුම් කරන්නේ,
(1) ව්‍යාපාරයේ අයිතිකරුවන්ගේ මුළු ආයෝජන ය.
(2) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර දැරීමට සිදුවන වියදම් ය.
(3) ව්‍යාපාරයට ස්ථාවර වත්කම් මිලදී ගැනීමට සිදුවන වියදම් ය.
(4) එදිනෙදා ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී දැරීමට සිදුවන වියදම් ය.

35. ව්‍යාපාරයකට විකුණුම් වැඩිකර ගැනීම සඳහා ලබා දෙන උපදෙස් හඳුන්වන්නේ,
(1) යටිතල පහසුකමක් ලෙස ය. (2) තාක්ෂණික පහසුකමක් ලෙස ය.
(3) අලෙවි පහසුකමක් ලෙස ය. (4) නිෂ්පාදන පහසුකමක් ලෙස ය.

36. සමස්ත ව්‍යාපාරය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වන්නේ,
(1) මූල්‍ය සැලැස්ම තුළිනි. (2) ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය තුළිනි.
(3) පරිපාලන සැලැස්ම තුළිනි. (4) විධායක සාරාංශය තුළිනි.

- ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත වියදම් කිහිපයක් පහත දැක්වේ.

A - ව්‍යාපාර සැලැස්ම සකස් කිරීමේ වියදම රු. 10 000
B - ව්‍යාපාරයට විදුලි සබඳතා ලබා ගැනීමේ වියදම රු. 15 000.
C - සේවකයින්ට වැටුප් ගෙවීමට යන වියදම රු. 30 000.
D - ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍යය උපකරණ ගැනීමට රු. 25 000
E - විකිණීම සඳහා බඩු මිලදී ගැනීම සඳහා දැරීමට සිදුවන වියදම රු. 40 000
F - ව්‍යාපාරයට අවශ්‍ය ලී බඩු මිලදී ගැනීම සඳහා දැරීමට සිදුවන වියදම රු. 35 000

ඉහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 37 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

37. ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර දැරීමට සිදුවන වියදම් වන්නේ,
(1) A හා B ය. (2) B හා D ය. (3) A හා D ය. (4) D හා F ය.

38. ව්‍යාපාරයේ දෛනික කටයුතු සඳහා දැරීමට සිදුවන වියදම් වන්නේ,
(1) A හා E ය. (2) C හා E ය. (3) D හා E ය. (4) B හා C ය.

39. මෙම ව්‍යාපාරය සඳහා දැරීමට සිදුවන මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම වන්නේ,
(1) රු. 60 000 කි. (2) රු. 65 000කි. (3) රු. 75 000කි. (4) රු. 100 000 කි.

40 දසුන් තම ව්‍යාපාරය සඳහා තමා ඉතිරි කරගත් රු. 500 000 ක මුදල යෙදවීමටත් රු. 400 000 ක බැංකු ණයක් ලබා ගෙන ආයෝජනය කිරීමටත් අදහස් කරයි. එමෙන් ම රු. 200 000 කට කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගැනීමටත් රු. 60 000ක උපකරණ ගැනීමටත් අදහස් කරයි.
මෙම තොරතුරුවලට අනුව දසුන්ගේ ව්‍යාපාරයේ ඇස්මේන්තුගත,
(1) මුළු ගලා ඒම් රු. 900 000 කි. (2) මුළු මුදල් ගලා යාම් රු. 200 000 කි.
(3) මුළු ආයෝජනය රු. 700 000 කි. (4) මුළු ස්ථාවර වත්කම් රු. 60 000 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **ව්‍යවසායකත්ව අධ්‍යයනය - II** | කාලය පැය 02 යි

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

(01) යුහගී සහජ නිර්මාණශීලී කුසලතාවයකින් හෙබි තැනැත්තියකි. ඇය තම නිර්මාණය කිරීමට ළමා වියේ සිටම ප්‍රියතාවයක් දැක්වූවා ය. පාසල් අධ්‍යාපනයේ දී මෙන්ම ඉන් පසුව ද ඇය චිත්‍ර කලාවට වැඩි ලැදියාවක් දක්වූවා ය. ඇයගේ විනෝදාංශය වූයේ චිත්‍ර කලාව ආශ්‍රිත නිර්මාණ සිදු කිරීමයි. එම නිසා ඇය රෙදි පින්තාරු කිරීමේ ව්‍යාපාරයක් ඇරඹීමට සිහින මවමින් සිටියා ය. ඒ අතරතුර ඇය බතික් නිර්මාණ ශිල්පය පිළිබඳ පාඨමාලාවක් ද හැදෑරුවා ය.

පාසල් අධ්‍යාපනය නිමකල ඇගේ සොයුරා වන තරිඳුගේද සහාය ඇතිව බතික් හා පින්තාරු ඇඳුම් සැකසීමේ ව්‍යාපාරයක් ඇරඹීමට යුහගී තීරණය කළා ය. ඒ සඳහා ඇය නිතර වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයින් ගනුදෙනු කරන ආකාරය නිරීක්ෂණය කළ අතර අන්තර්ජාලය වැනි මූලාශ්‍ර භාවිත කරමින් වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු රැස් කළා ය.

ඇය තම බතික් හා පින්තාරු ඇඳුම් දේශීයව මෙන්ම විදේශීයව ද අලෙවි කිරීමට බලාපොරොත්තු වන අතර විද්‍යුත් වෙළඳාම හරහා තම නිෂ්පාදන අලෙවි කිරීමට සැලසුම් කරයි. පාසල් කාර්යමණ්ඩලයේ ගුරුතුමියන්, නිළධාරිනියන් සහ කාර්යාලවල සේවයේ නියුතු අය ඉලක්ක කර ගනිමින් වැඩි විලාසිතා ප්‍රමාණයක් නිපදවීමට ද ඇය අදහස් කරයි. තම නිෂ්පාදිත පිළිබඳ අත් පත්‍රිකා සහ අන්තර්ජාලය මගින් ප්‍රචාරය කිරීමටත් ඇය බලාපොරොත්තු වේ.

ඇයගේ ව්‍යාපාරික කටයුතු පුළුල් කර ගැනීමට 5% ක වාර්ෂික පොළී අනුපාතය යටතේ රාජ්‍ය බැංකු විසින් ලබාදෙන දේශීය කර්මාන්ත නගාසිටුවීමේ ව්‍යාපෘතිය යටතේ ලබාදෙන ණය යෝජනා ක්‍රමයෙන් රු. 200 000/= ක ණයක් ලබාගැනීමට ද ඇය අපේක්ෂා කරයි.

වෙළෙඳපොළ විශ්ලේෂණයෙන් හඳුනාගත් පරිදි තරගකරුවන්ගේ තරගකාරී මිල ගනන් ආශ්‍රයෙන් මිල නියම කිරීමටත්, තරගකරුවන් මෙන් විද්‍යුත් ක්‍රම හරහා ඇණවුම් භාරගෙන කුරියර් සේවය හරහා සහ තමාගේම අලෙවි රථයක් මගින් බෙදාහැරීමටත් අදහස් කරයි.

ඇයගේ ව්‍යාපාරයට අදාළව ඇස්තමේන්තුගත වියදම් කිහිපයක් පහත දක්වේ.

| | රු. |
|---|---|
| බෙදාහැරීමේ රථයක් මිලදී ගැනීම | 900 000 |
| අලෙවි අංශය සඳහා කාර්යාල උපකරණ | 45 000 |
| පරිපාලන අංශය සඳහා කාර්යාල උපකරණ | 15 000 |
| පරිපාලන ගොඩනැගිල්ල | 100 000 |
| අලෙවි සේවක වැටුප් | 10 000 |
| අලෙවි රථ රක්ෂණ ගාස්තු | 400 |
| අත්පත්‍රිකා මුද්‍රණ වියදම් | 18 000 |

ඉහත තොරතුරු ඇසුරෙන් යුහගීගේ ව්‍යාපාරයේ පහත සඳහන් දෑ සම්බන්ධ පිළිතුරු සපයන්න.

(i) යුහගීට මෙම ව්‍යාපාර අදහස පහළ වීමට හේතු වූ මූලාශ්‍ර දෙකක් ලියන්න.

(ii) යුහගී හට පහත ගති ලක්ෂණ පවතින බව සිද්ධිය ඇසුරින් සනාථ කරන්න.

a. නිර්මාණශීලීත්වය b. තොරතුරු සොයා බැලීම

(iii) යුහගීගේ ව්‍යාපාරයේ අලෙවි ප්‍රවර්ධන උපක්‍රම දෙකක් ලියා දක්වන්න.

(iv) යුහගීගේ ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් ලියන්න.

(v) යුහගී වෙළඳපල විශ්ලේෂණයකට තොරතුරු ලබාගන්නා ලද ආකාර දෙකක් සඳහන් කරන්න.

(vi) තරගකරුවන්ගේ අලෙවි උපාය මාර්ග දෙකක් සිද්ධිය ඇසුරෙන් ලියන්න.

(vii) යුහගීගේ ඉලක්කගත වෙළෙඳපොළ කොටස කවුරුන් ද?

(viii) අලෙවි ස්ථාවර වත්කම් දෙකක් වටිනාකම් සහිතව ලියා දක්වන්න.

(ix) මෙම ව්‍යාපාරයේ පරිපාලන ස්ථාවර වත්කම් දෙකක් ලියන්න.

(x) යුහගීගේ ව්‍යාපාරයේ අලෙවි වියදම් අයිතම දෙකක් වටිනාකම් සහිතව සඳහන් කරන්න.

(ලකුණු $02 \times 10 = 20$ යි.

(02) (i) ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයකුට හිමිවන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.
(ii) ව්‍යාපාර අදහසක් ක්‍රියාත්මක කිරීමේදී "අවදානම් භාර ගැනීම" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(iii) වර්තමාන සමාජයේ දැකිය හැකි ව්‍යවසායකයින් වර්ග දෙකක් දක්වන්න.
(iv) ව්‍යාපාරිකයෙකු හා ව්‍යවසායකයෙකු අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.
(v) ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ හතරක් දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි.)

(03) (i) කුඩා පරිමාණ ව්‍යාපාරවල සීමා ලෙස හඳුන්වන්නේ මොනවා ද?
(ii) පරිසර ප්‍රවණතා පිළිබඳ සැලකිලිමත් වීමේ වැදගත්කම් දෙකක් ලියන්න.
(iii) ව්‍යවසායකයෙකු වර්ධනය කරගත යුතු මූලික කුසලතා දෙකක් ලියන්න.
(iv) ව්‍යාපාරවලට බලපෑම් කරන අභ්‍යන්තර හා බාහිර පරිසරයන් අතර පවතින වෙනස්කම් දෙකක් ලියන්න.
(v) කුඩා පරිමාණ ව්‍යාපාර තුළින් අර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වයන් හතරක් ලියන්න.

(ලකුණු 02 × 05 = 10 යි.)

(04) (i) "පවත්නා භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපොළකට ඉදිරිපත් කිරීම" සඳහා වන උදාහරණ දෙකක් ලියන්න.
(ii) පහත සඳහන් ව්‍යාපාර සඳහා උචිත ස්ථාන මොනවා ද?
a. තොග භාණ්ඩ අලෙවිසැලක්
b. රූපලාවන්‍යාගාරයක්
(iii) SCAMPER ආකෘතියේ එක් සාධකයකි "ආදේශ කිරීම." වෙනත් සාධක දෙකක් ලියන්න.
(iv) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ගතයුතු තීරණ හතරක් ලියන්න.
(v) නිෂ්පාදිතයක් නම් කොට එය ප්‍රභේදනය කළ හැකි ආකාර හතරක් දක්වන්න.

(ලකුණු 02 × 05 = 10 යි.)

(05) (i) පේටන්ට් බලපත්‍රය ලබාදෙන රාජ්‍ය ආයතනයේ නම කුමක් ද?
(ii) පේටන්ට් බලපත්‍රය ලබාදීම සඳහා නව සොයා ගැනීමක් ලෙස සලකා බලන අවස්ථා දෙකක් ලියන්න.
(iii) යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමට භාවිත කරන විශ්ලේෂණ වර්ග දෙකක් නම් කරන්න.
(iv) ව්‍යාපාර ආයතනයකට බාහිර පරිසරයෙන් ලැබිය හැකි අවස්ථාවක් හා තර්ජනයක් සඳහා උදාහරණය බැගින් ලියන්න.
(v) හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණ හතරක් ලියන්න.

(ලකුණු 02 × 05 = 10 යි.)

(06) (i) ''නිෂ්පාදන සැලැස්ම'' යන්නෙහි අදහස දක්වන්න.
(ii) වෙළෙඳපොළ විශ්ලේෂණයකදී අවධානය යොමුකළ යුතු කරුණු දෙකක් ලියන්න.
(iii) නිෂ්පාදන සැලැස්මක ඇතුළත් කරුණු දෙකක් දක්වන්න.
(iv) අලෙවි මිශ්‍රයේ ප්‍රධාන විචල්‍යයන් (4Ps) හඳුන්වන්න.
(v) නිෂ්පාදන ක්‍රියාවලිය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

යෙදවුම් → ක්‍රියාවලිය → නිමැවුම

(ලකුණු 02 × 05 = 10 යි.)

(07) රොෂාන් අමරසිංහ මහතාගේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන "රොෂාන් කැෆේ" ව්‍යාපාරය වෙනුවෙන් සැකසූ සැලැස්මට අදාළ තොරතුරු කිහිපයක් පහත වේ.

| | රු. |
|---|---|
| ලියාපදිංචි ගාස්තු | 2 000 |
| ව්‍යාපාර පරිශ්‍රය සැකසීම | 40 000 |
| ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම | 3 000 |
| කෝපි සකසන යන්ත්‍රය සඳහා | 100 000 |
| ව්‍යාපාරයට අවශ්‍ය ලීබඩු උපකරණ | 150 000 |
| වෙළෙඳපොළ සමීක්ෂණ වියදම් | 5 000 |
| සමාරම්භක දින උත්සව වියදම් | 20 000 |
| ව්‍යාපාර කටයුතු සති දෙකක් කරගෙන යාම සඳහා අපේක්ෂිත වියදම | 80 000 |

අවශ්‍ය වන්නේ:-

1. "රොෂාන් කැෆේ" ව්‍යාපාරය සඳහා යෝජිත මුළු ආයෝජන ඇස්තමේන්තුව පිළියෙල කරන්න.

(ලකුණු 02 × 05 = 10 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(1) | 2 -(2) | 3 -(3) | 4 -(4) | 5 -(4) | 6 -(1) | 7 -(1) | 8 -(2) | 9 -(4) | 10 -(3) |
| 11-(2) | 12 -(4) | 13 -(2) | 14 -(2) | 15 -(3) | 16 -(3) | 17 -(2) | 18 -(3) | 19 -(1) | 20 -(1) |
| 21-(4) | 22 -(2) | 23 -(3) | 24 -(2) | 25 -(4) | 26 -(2) | 27 -(1) | 28 -(2) | 29 -(3) | 30 -(4) |
| 31-(3) | 32 -(3) | 33 -(1) | 34 -(4) | 35 -(3) | 36 -(4) | 37 -(1) | 38 -(2) | 39 -(1) | 40 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. • විනෝදාංශ හා ලැදියා තුළින් • පුද්ගල දක්ෂතා
• නිර්මාණශීලී චින්තන හැකියා තුළින් • වෙළඳපල සමීක්ෂණ තුළින්
(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02)

ii. a. ඇය සහජ නිර්මාණශීලී කුසලතාවයකින් හෙබි තැනැත්තියකි. (ලකුණු 01)
b. පාරිභෝගිකයින් ගනුදෙනු කරන ආකාරය සොයා බැලීම.
අන්තර්ජාල මූලාශ්‍ර මගින් වෙළෙඳපොල තොරතුරු සෙවීම. (ලකුණු 01)

iii. • අත් පත්‍රිකා මගින් • අන්තර්ජාලය මගින්
(එක් කරුණකට 01 බැගින් කරුණු 02ට ලකුණු 02 යි.)

iv. ශක්තීන් :- • බතික් නිර්මාණශිල්පය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.
• යුහගීගේ සොයුරාගේ සහාය. (එක් කරුණකට ලකුණු 01යි.)
අවස්ථා :- • රාජ්‍ය බැංකු විසින් ලබාදෙන දේශීය කර්මාන්ත නගා සිටුවීමේ ණය ව්‍යාපෘතියත
(එක් කරුණකට ලකුණු 01)

v. • පාරිභෝගිකයින් ගනුදෙනු කරන ආකාරය නිරීක්ෂණය කිරීමෙන්
• අන්තර්ජාලය වැනි මූලාශ්‍ර මගින් (එක් කරුණකට 01 බැගින් කරුණු 02ට ලකුණු 02යි.)

vi. • තරගකාරී මිල ගනන් ආශ්‍රයෙන් මිල නියම කිරීම.
• විද්‍යුත් ක්‍රම හරහා ඇණවුම් භාරගැනීම.
• කුරියර් සේවය හරහා බෙදා හැරීම. (එක් කරුණකට 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි.)

vii. • පාසල් කාර්ය මණ්ඩල නිලධාරීන් • ගුරුවරුන්
• කාර්යාල සේවයේ නියුතු අය. (එක් කරුකට 01 බැගින් කරුණු 02ට ලකුණු 02)

viii. බෙදාහැරීමේ රථය රු. 900 000.00
අලෙවි අංශ කාර්යාල උපකරණ රු. 45 000.00
(වටිනාකම සහිතව ලියා ඇත්නම් එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකට ලකුණු 02යි. වටිනාකම රහිතව ලියා ඇත්නම් ලකුණු ½ බැගින් ලකුණු 01යි.)

ix. • පරිපාලන අංශයේ කාර්යාල උපකරණ
• පරිපාලන ගොඩනැගිල්ල (වටිනාකම රහිතව හෝ සහිතව එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 2ට ලකුණු 02යි.)

x. • අලෙවි සේවක වැටුප් රු. 10 000.00 • අත් පත්‍රිකා මුද්‍රණ වියදම් රු. 18 000.00
• අලෙවි රථ රක්ෂණ ගාස්තු රු. 400.00 (වටිනාකම සහිත එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02යි.)

(02) i. • ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම. • කාර්යයන්හි විවිධත්වයක් ඇති වීම.
• සමාජීය සුසාධනය සඳහා දායක වියහැකි වීම. • ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකි වීම.
• ආකර්ණීය ලාභයක් හිමිවීම. • ස්වයංපෝෂිත බව.
• වර්ධනය සඳහා පුද්ගලයින්ට ලැබෙන්නා වූ උපරිම අවකාශය
• නිදහස හා ඉතා ඉහළ තෘප්තියකට පත් වීම. (එක් කරුණකට 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි.)

ii. එනම් ව්‍යවසායකයාගේ නව අදහස සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට ඇති ඉඩ ප්‍රස්ථාවයි. අවධානමට ප්‍රධාන හේතුව අවිනිශ්චිතතාවයයි. (ගැලපෙන පිළිතුරට ලකුණු 02යි.)

iii. • ව්‍යාපාර ව්‍යවසායකයෝ • සමාජීය ව්‍යවසායකයෝ
• අභ්‍යන්තර ව්‍යවසායකයෝ (වර්ග 01කට 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි.)

iv.

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| • ගතානුගතික සම්ප්‍රදායිකයෙකි.<br>• අවදානම් භාරගැනීමට එතරම් කැමැත්තක් නොදක්වයි.<br>• තරගයට මුහුණ දීමට එතරම් කැමැත්තක් නොදක්වයි.<br>• පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන නොගනී.<br>• ගතානුගතිකව ගැටලු විසඳීමට උත්සහ ගනී.<br>• ඉතා ආසන්න ඉලක්ක ඇතිකර ගනියි.<br>• ව්‍යාපාර තිබෙන තත්ත්වයෙන් ම පවත්වාගෙන යයි. | • නවෝත්පාදකයෙකි.<br>• දරිය හැකි අවදානම් භාරගනී.<br>• තරගය කැමැත්තෙන් සොයා යයි.<br>• පවතින සම්පත්වලින් අවශ්‍යතාවයට අනුව උපරිම ප්‍රයෝජන ගනී.<br>• ගැටලු නිර්මාණශීලීව විසඳයි.<br>• දූරදර්ශීව ඉලක්ක පිහිටුවා ගනියි.<br>• පවතින තත්වය පිළිබඳ සෑහීමකට පත් නොවී දිනෙන් දින පුළුල් කරයි. |

(එක් කරුණකට 01 බැගින් කරුණු 02කට ලකුණු 02යි.)

v. • දේශීය සම්පත් උපයෝජනය කිරීම • ප්‍රාදේශීය සංවර්ධනය සිදු වීම.
• නව භාණ්ඩ හා සේවා වෙළඳපලට ඉදිරිපත් කිරීම. • රැකියා අවස්ථා ජනනය කිරීම.
• විදේශ විනිමය ඉපයීමේ හැකියාව. • රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම.
• ආදායම් බෙදී යාමේ විෂමතාව අඩු වීම. (එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)

(03) i. ව්‍යාපාරයක් ආරම්භකර පවත්වාගෙන යාමේදී එම ක්‍රියාකාරීත්වයට බාධා පමුණුවන හෝ ක්‍රියාකාරීත්වය සීමා කරවන සාධක සමූහය වේ. (අදහස ඇතිනම් ලකුණු 02යි.)

ii. • නව ආදායම් මාර්ග සකස්කර ගැනීමේ හැකියාව වැඩිකර ගැනීම සඳහා.
• වෙළඳපල තුළ තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා.
• පරිසරය තුළ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සම්පත් භාවිතා කිරීම.
• සාර්ථක ව්‍යාපාරික අවස්ථා ග්‍රහණය කර ගැනීම සඳහා
• පාරිසරික ගැටලු අවම කර ගැනීමට
• ආවේණික සම්පත් සුරැකීම සහ අනාගතය සඳහා ඉතිරි කිරීම. (අදහස පැහැදිලි වන ලෙස ලියා ඇති එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02)

iii. තාක්ෂණික කුසලතා මානව කුසලතා
සංකල්පනාත්මක කුසලතා කණ්ඩායම් සමග කටයුතු කිරීමේ කුසලතා
සන්නිවේදන කුසලතා උපදේශන කුසලතා
ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතාව. (එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු 02කට ලකුණු 02)

iv.

| • අභ්‍යන්තර පරිසරය | • බාහිර පරිසරය |
|---|---|
| • ව්‍යාපාරයට පාලනය කළ හැකි වීම | • ව්‍යාපාරයට පාලනය කළ නොහැකි වීම. |
| • ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකි වීම. | • අවස්ථා හා තර්ජන හඳුනාගත හැකි වීම. |

(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02)

v. • සේවා වියුක්තිය වැඩි වීම. • ජාතික නිෂ්පාදන වැඩි වීම.
• ආදායම් බෙදී යාමේ විෂමතාව අඩු වීම. • මහා පරිමාණ ව්‍යාපාර නොසපයන භාණ්ඩ හා සේවා සැපයීම
• දේශීය දැනුම හා සම්පත් භාවිතය (එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)

(04) i. (ගැළපෙන උදාහරණ 01කට ලකුණු 01 බැගින් උදාහරණ 02කට ලකුණු 02යි.)

ii. a. වාහන නවතා තැබීමට ඉඩකඩ ඇති හා මාර්ග පහසුකම් ඇති ස්ථානයක් (ලකුණු 01)
b. ජනාකීර්ණ ස්ථානයක් (ලකුණු 01 යි.)

iii. සම්බන්ධ කිරීම වෙනත් කාර්යන් සඳහා යොදා ගැනීම.
විශාල කිරීම. ඉවත් කිරීම.
කුඩා කිරීම. යළි සැකසීම.
(එක් සාධකයකට (ල. 01) බැගින් සාධක දෙකට (ල. 02)

iv. • ව්‍යාපාර සඳහා කොතරම් කැපවිය හැකි ද? • ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩය හෝ සේවය කුමක් ද?
• ඉලක්කගත පාරිභෝගිකයා කවුද? • තරගයේ ස්වභාවය කෙබඳු ද?
• ඉපැයීම ප්‍රමාණවත් ද? • ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේ ද?
• තනිව හෝ හවුල්ව ව්‍යාපාර ආරම්භ කරනවා ද? • ව්‍යාපාරය පිහිටුවන ස්ථානය කෙබඳු ද?
• ව්‍යාපාරය තුළින් සමාජයට කවර ප්‍රතිලාභ අත්කර දිය හැකි ද? (එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)

v. කිරිපිටි :- • Jambo pack • ආර්ථික ඇසුරුම් (Economy pack) • Budjet pack • Sache pack
(පිළිගත හැකි උදාහරණයක් ගෙන ඇත්නම් එකකට ලකුණු ½ බැගින් ආකාර 04කට ලකුණු 02)

(05) i. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (ලකුණු 02යි.)

ii.
- නව නිමැවුමක්
- නවයන්ත්‍රයක්
- නව ක්‍රියාවලියක්
- ඉහත කරුණුවල සංකලනයක්
- පවත්නා සොයා ගැනීමක වැඩිදියුණු කිරීමක් (එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02)

iii.
- සාර්ව විශ්ලේෂණය
- සූක්ෂම විශ්ලේෂණය
- ශදුඅත විශ්ලේෂණය (එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02)

iv. අවස්ථා (ගැළපෙන අවස්ථාවක් සඳහා ලකුණු 01) තර්ජන (ගැළපෙන තර්ජනයක් සඳහා ලකුණු 01)

v.
- ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කළ හැකි වීම.
- පරිසරයේ මතුවන අවශ්‍යතා සපුරාලිය හැකි වීම.
- වෙනස්වන අවශ්‍යතා හා වුවමනාවලට ප්‍රතිචාර දැක්විය හැකි වීම.
- තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීම.
- තාක්ෂණය සමග ගැළපිය යුතු වීම.
- මුහුණදෙන අවදානම අවදානම අවම කරගත හැකිවීම.
- ව්‍යාපාරයක් බවට පරිවර්ථනය කිරීමෙන් ඉපැයීමක් කළ හැකි වීම.
- ස්වකීය ව්‍යාපාර අදහස ආරක්ෂා කරගත හැකි වීම. (එක් ලක්ෂණයකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)

(06) i. කිසියම් අපේක්ෂිත නිෂ්පාදන ඒකක ප්‍රමාණයක් සඳහා දැරීමට සිදුවන පිරිවැය ඇස්තමේන්තු කර පිළියෙල කරනු ලබන ලේඛනය නිෂ්පාදන සැලැස්ම වශයෙන් හැඳින්වේ. (අදහස දැක්වෙන පිළිතුර සඳහා ලකුණු 02)

ii.
- ස්වකීය භාණ්ඩය හෝ සේවාව සඳහා ඇති ඉල්ලුම
- ඉලක්කගත පාරිභෝගිකයා
- තරගකරුවන් (එක් කරුණකට 01 බැගින් කරුණු 02කට ලකුණු 02)

iii.
- නිෂ්පාදන ක්‍රියාවලිය
- නිෂ්පාදන ස්ථාවර වත්කම්
- නිෂ්පාදන පිරිවැය
- ඒකක පිරිවැය

(එක් කරුණකට 01 බැගින් කරුණු 02කට ලකුණු 02)

iv. නිෂ්පාදිතය මිල
ස්ථානය ප්‍රවර්ධනය
(එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 02කට ලකුණු 01)

v. ගැළපෙන උදාහරණයක් දක්වා ඇත්නම් ලකුණු 02යි.)

(07)

"රොෂාන් කැෆේ" ව්‍යාපාරය
මුළු ආයෝජන ඇස්තමේන්තුව (01)

| | යෝජිත අයිතිකරු යෙදූ | ආයෝජනය බැංකු ණය | මුළු ආයෝජනය |
|---|---|---|---|
| <u>ස්ථාවර වත්කම්</u> (½) | | | |
| ගොඩනැගිලි | 500 000 (½) | | 500 000 |
| යන්ත්‍ර | 100 000 (½) | | 100 000 |
| ලී බඩු | | 150 000 (01) | 150 000 |
| මුළු ස්ථාවර වත්කම් | 600 000 | 150 000 | 750 000 (½) |
| <u>ආරම්භ කිරීමට පෙර දැරූ වියදම්</u> (½) | | | |
| ලියාපදිංචි ගාස්තු | 2 000 (½) | | 2 000 |
| පරිශ්‍රය සැකසීම | 40 000 (½) | | 40 000 |
| සැලැස්ම සැකසීම | 3 000 (½) | | 3 000 |
| වෙළඳපොළ සමීක්ෂණ වියදම් | 5 000 (½) | | 5 000 |
| සමාරම්භක උත්සව වියදම් | 20 000 (½) | | 20 000 |
| මුළු ආරම්භ කිරීමට පෙර දැරූ වියදම් | 70 000 | | 70 000 (½) |
| <u>කාරක ප්‍රාග්ධනය</u> (½) | | | |
| දෛනික ව්‍යාපාර කටයුතු සඳහා | 80 000 (01) | | 80 000 |
| මුළු කාරක ප්‍රාග්ධනය | 80 000 | | 80 000 |
| මුළු ආයෝජනය (½) | 750 000 | 150 000 | 900 000 (½) |